**ශීර්ෂය 236 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 විගණන මතය**

-----------------

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020ජුනි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතයසඳහාපදනම**

**--------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ භාගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවටප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණ මා ප්‍රකාශ කරමි.

(අ)මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ)ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍යප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ඇපලේඛනය**<br>මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු බව. | ඉදිරියේදී පවත්වාගෙනයාමට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දුනිමි. |
| **(ආ) විදුලිඋපකරණපිළිබඳලේඛනය**<br>මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරවආයතනයේ විදුලි උපකරණ පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් සකස් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 454 (2) ප්‍රකාරවආයතනයේ විදුලි උපකරණ පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා ගත යුතු බව. | ඉදිරියේදී පවත්වාගෙනයාමට අදාල නිළධාරීන් වෙත උපදෙස් ලබා දුනිමි. |
| **(ඇ) නිවාඩුලේඛනය**<br>ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 ප්‍රකාරව නිවාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය ප්‍රකාරව නිවාඩු ලේඛනයයාවත්කාලීන කිරීම කල යුතු වීම. | 2019 වර්ෂයේ නිවාඩු ලේඛනය සියයට 80 පමණ අවසන් කර ඇති අතර ඉතිරි අඩුපාඩු යාවත්කාලීන කරන ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලදී. |

**1.6.2. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්**,** ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2020 වර්ෂයේ සිට අදාළ සමාලෝචනයන් සිදුකර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට සටහන් කරගතිමි. |

**1.6.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 115 | 3,601,922 | ඉකුත් වර්ෂවලදී සිදු කරන ලද මුද්‍රණ කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු මුදල් 2019 වර්ෂයේදී ගෙවීම් කිරීමේදී මුදල්රෙගුලාසිප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු බව. | 2019 වර්ෂයේදි ඒ සඳහා වන රු. 3,587,242ක මුදල් ගෙවීමේදි මුදල් රෙගුලාසි 115 ප්‍රකාරව කටයුතු කර නොමැතිඅතර 2018 වර්ෂයට අදාළරු.14,680ක ඉන්වොයිසිය සඳහා මේ දක්වා ගෙවීම් කර නොමැත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව සැලසුම් කළ පරිදි ඉල්ලුම් කලයුතු අග්‍රිමය හා ඉල්ලුම් කළ අග්‍රිමය අතර රු. මිලියන 119 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එය සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළයුතු අග්‍රිමයෙන් සියයට 85 ක වැඩිවීමකි. එසේම ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබුණු අග්‍රිමය අතර රු. මිලියන 134 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒය ඉල්ලුම් කළ අග්‍රිමයෙන් සියයට 52 ක අඩුවීමකි. | නිසි පරිදි අග්‍රිමය සැලසුම් කළ යුතු අතර සැලසුම් කළ පරිදි අග්‍රිම ඉල්ලුම් කළ යුතු බව. | අනුමත සීමාව ඉක්මවා අක්මුදල් ඉල්ලුම් කර නොමැති බව සඳහන් කරන අතර එම ඉල්ලුම් කළ ප්‍රමාණයට වඩා අඩු අක්මුදල් ප්‍රමාණයක් භාණ්ඩාගාරය වෙතින් ලැබී ඇති බව සඳහන් කරමි. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019දෙසැම්බර් 03දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ජේදය ප්‍රකාරව සටහන් අංක (iii) යටතේ වන බැදීම් හා බැරකම්ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබනබැරකම් සමඟසැසඳිය යුතු වුවද,දෙපාර්තමේන්තුවේමූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති රු.6,694,255කබැරකම් භාණ්ඩාගාරය විසින් නිකුත්කර ඇති බැරකම් ප්‍රකාශය සමඟ සැසඳීමට නොහැකි විය. | චක්‍රලේඛය ප්‍රකාරව බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැරකම් සමඟ සැසඳිය යුතුබව . | භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති බැරකම් ප්‍රකාශය නිරවද්‍ය නොවන බව පෙනී ගිය අතර එය වැය ශීර්ෂ අනුව සැසඳීම සඳහා තොරතුරු ලබා දී නොතිබුණු බැවින් දෙපාර්තමේන්තු ලේඛනවලට අනුව රු.6,694,255ක බැරකම් මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කර ඇති බව සඳහන් කරමි. |
| (ආ)වැය විෂයය 2001 ගොඩනැගිලි හා ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,441,483 ක බැරකම් වෙනුවට රු.3,761,139 ක් බැරකම් ලෙස දැක්වීමෙන් බැරකම්වල වටිනාකම රු.2,319,656 ක් වැඩියෙන් දක්වාතිබුණි. | බැරකම් වටිනාකම නිවැරදිව ගිණුම් තැබිය යුතු බව | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදු නොවීමට වග බලා ගන්නා අතර අදාළ නිලධාරීන්ට ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා දුනිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 හා 2017 වර්ෂවලදී සිංහල - දෙමළ සහ දෙමළ - සිංහල පරිවර්තන මෘදුකාංග 2ක් සකස් කිරිම සඳහා රු.7,240,000ක් වැය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදිවත් එම මෘදුකාංගය භාවිතා කර සිංහල - දෙමළ | පරිවර්තන කටයුතු සඳහා සකස් කර ඇති මෘදුකාංග උපරිම වශයෙන් භාවිතයට ගැනීම කළ යුතු බව. | දැනට මෙම පරිවර්තන මෘදුකාංගයේ කටයුතු සියයට සියයක් අවසන්ව නොමැත. මෘදුකාංගයේ නිරවද්‍යතාව වැඩිවීම ඇතුළත් කරනු ලබන දත්ත ප්‍රමාණය මත තීරණය වේ. දැනට ඇතුළත්කර ඇති දත්ත ප්‍රමාණයට සාපේක්ෂව 100% නිවැරදි පරිවර්තනයක් |

| | | |
|---|---|---|
| පරිවර්තන කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි. | | මෘදුකාංගය වෙතින් නොලැබේ. එබැවින් නැවත භාෂා පරිවර්තකයකු විසින් පරීක්ෂාකර සංස්කරණය කළ යුතු වේ. දැනට මෙම දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තකයින් මෙම මෘදුකාංගය එම මට්ටමින් භාවිත කරනු ලබයි. |

**3.2 ප්‍රසම්පාදනයන්**

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) බස වඩමු - හද දිනමු කථන භාෂා වැඩසටහන ප්‍රචාරය කිරීමේ සම්බන්ධීකරණ කටයුතු සඳහා රු. මිලියන 1.56ක් වැය කර තිබුණු අතර ප්‍රචාරණ ආයතනයක් තෝරාගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව තරඟකාරී මිල කැඳවීම් කලයුතු බව. | ගුවන් විදුලි සංස්ථාව සමඟ මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරන ආයතන කිහිපයක් නොතිබු බැවින් ඒ අතුරින් අවම මිල ගණන් සහිත ආයතනයක් තෝරා ගැනීමට අපහට අවස්ථාව නොතිබුණි. |
| (ආ)දෙවන බස විභාග අපේක්ෂකයින්ට ඉහත වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීමේ පෝස්ටර් මුද්‍රණය කිරීම සඳහා රු.665,000ක් වැය කර තිබුණද, ඒ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ 6.3.6 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ සියළුම කමිටු සාමාජිකයින් විසින් අත්සන් කලයුතු බව. | මින් ඉදිරියට එවැනි අතපසුවීම් සිදු නොවීමට වගබලා ගන්නා ලෙස අදාළ නිළධාරින් දැනුවත් කළෙමි. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 133 හා 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර අනුමත වී ඇතත් මේ දක්වා ඒ සඳහා නිලධාරියෙකු පත්කර නැත. එම තනතුර සඳහා නිලධාරියෙකු පත් කළ වහාම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)2019 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 45ක් විය. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වූ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව. | දෙපාර්තමේන්තුවේ ඇතිවී ඇති පුරප්පාඩු සඳහා දෙපාර්තමේන්තු බඳවා ගැනීම් යටතේ ද අනෙකුත් පුරප්පාඩු සඳහා අදාළ සේවා යටතේ ද නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු සහ ඉල්ලීම් කර ඇති බව සඳහන් කරමි. |
| (ආ)2018 ජනවාරි 24 දිනැති අංක 2018/02 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ6.1 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකුම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවන් ඇතුළත් කරමින් 2019 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු බව. | දෙපාර්තමේන්තු නිළධාරින්ගෙන් පුහුණු අවශ්‍යතා ලබා ගෙන දෙපාර්තමේන්තුව වෙත පුහුණු ආයතනවලින් කරන ලද දැනුම් දීම අනුව නිලධාරින් පුහුණුව සඳහා යොමු කරන ලදි. |